පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 අගෝස්තු
பொதுக்கலைமாணி பரீட்சை (வெளிவாரி) - 2016 ஆகஸ்ட்
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2016

දර්ශනය

PHG IV (සංක්ෂිප්ත බටහිර දර්ශනය)

මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
කාලය : පැය තුනයි.

---

01. "තර්කය මත පදනම්ව විශ්වය පිළිබඳ ස්වභාවවාදී අර්ථ කතනයක් ලබාදුන් නිසා මෛලේසියානු ගුරුකුලයේ තේල්ස් (Thales of milletus) පළමු දාර්ශනිකයා ලෙස සලකනු ලබයි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද ?

02. සදාචාරය හා මානව ඇගයීම් (morality and human values) පිළිබඳ සොක්‍රටීස්ගේ දැක්ම ගැන විස්තරයක් ලියන්න.

03. "ඉන්ද්‍රිය ලෝකය තුළ ස්වාධීනව පවතින සාමාන්‍ය වස්තූන් අසම්පූර්ණ හා වෙනස්වන සුළු ඒවා වේ. නමුත් ඒවා අවසාන වශයෙන් සම්පූර්ණ හා නිත්‍ය ආකෘතීන් ගේ පිටපත්ය" ඉහත අදහස ඇසුරින් ප්ලේටෝ ගේ ආකෘතිවාදය (Platonic Forms)ඔබ විස්තර කරන්නේ කෙසේද ?

04. මධ්‍යතන යුගයේ ඔබ දකින විශේෂතා කවරේද ?

05. දෙවියන් පිළිබඳ සංකල්පය ඔබ නිර්වචනය කරන්නේ කෙසේද ? දෙවියන්ගේ පැවැත්ම තහවුරු කිරීම සඳහා තෝමස් ඇක්වයිනස් ඉදිරිපත් කළ තර්ක කෙටියෙන් විභාග කරන්න.

06. නූතන යුගයේ ඉතිහාසය යනු අධිකාරිවාදී සම්ප්‍රදායික චින්තනයට එරෙහිව චින්තනයේ නිදහස වෙනුවෙන් සිදුකළ විප්ලවයකි. ඔබ මෙම කියමන සමඟ එකඟ වන්නේද?

07. "මම සිතමි, එම නිසා මම පවතිමි " යන ඩේකාට්ස්ගේ කියමනෙහි ඇති වැදගත්කම කවරේද ? (I am thinking' threfor I exist) මෙම කියමන සම්බන්ධව ඔහු තර්ක කරන්නේ කෙසේද?

08. තර්කානුසාරී අණුවාදය (Logical Atomism) යන්නෙන් අදහස් වන්නේ කුමක්ද ? "ට්‍රැක්ටේටස් ( Tractatus) කෘතිය පොදුවේ සලකනු ලබන්නේ තර්කානුසාරී අනුවාදය ලෙසිනි. විට්ගන්ස්ටයින් ගේ තර්කානුසාරී අණුවාදය බට්‍රන්ඩ් රසල් සමඟ සමානව පෙනුනත් මෙම අදහස් දෙක නිශ්චිතවම එකම අදහසක් නොවේ." මේ පිළිබඳ අදහස් දක්වන්න.

09. එක්කෝ ;

විචාරාත්මක දර්ශනයට කාන්ට්ගේ (Critical Philosopy) දායකත්වය පැහැදිලි කරන්න.

නැත්නම්

ඓතිහාසික භෞතිකවාදය (Historical Materialism) සම්බන්ධ කාල් මාක්ස් ගේ දැක්ම සාකච්ඡා කරන්න.

10. එක්කෝ

මැත විට්ගන්ස්ටෙන්ගේ දාර්ශනික විමර්ශන (Philosopical Investigation) කෘතියේ එන ප්‍රධාන තර්කයන් කවරේදැයි සාකච්ඡා කරන්න.

නැතිනම්

පහත සඳහන් කුමන හෝ මාතෘකා තුනකට කෙටි සටහන් ලියන්න.

I. සාංදෘෂ්ටිකවාදය - Existentialism
II. බුද්ධිවාදය - Empiricism
III. තර්කය හා විශ්වාසය - Reason and faith
IV. ඩේකාට් සහ ලොක් - Descartes and Lock
V. පරාරෝපණය හෝ ප්‍රපංචවාදය - Alienation or Phenominology

***************************************